සතුට නිරූපනය කරමු



දුවේ පුතේ ඉහත රූප දෙක දෙස හොඳින් නිරීක්ෂණය කරන්න. ඔබේ හිතේ ඇතිවන හැඟීම කුමක්ද? පළවෙනි රූපය දෙස නිරීක්ෂණය කළ විට ඔබේ හිතේ දුකකුත් දෙවන රූපය නිරීක්ෂණය කළ විට ඔබේ හිතේ සතුටකුත් ඇති වන බව ඔබට දැනේවි. මෙසේ සිතේ ඇති වන එම හැඟීම් නිරූපණය වනුයේ මුහුණේ හා ශරීරයේ විවිධ ඉරියව් මගිනි.

ප්‍රසන්න බව මෙන්ම විනෝදය දැනවීමෙන් සතුට ප්‍රදර්ශනය වෙයි. පහත රූපයේ ශාරීරයේ අංග උපාංගවල ලක්ෂණ මෙන්ම එහිදී ඇස්, දෙතොල් , ඇහිබැමි, කට වැනි අංග උපාංග තිබෙන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න. මෙවැනි නිරූපණ තුළින් සිත සතුටු කිරීමට නර්තන ශිල්පීන් තම මුහුණෙහි සතුට ප්‍රකාශ කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

ක්‍රියාකාරකම

1. සතුට නිරූපණය වන අවස්ථා කිහිපයක් ලියන්න.
2. සතුට ප්‍රකාශ කිරීමේදී මුහුණෙහි සිදුවන වෙනස්කම් මොනවාද?
3. ඉහත දැකුවූ අවස්ථා දෙකක් නිරූපණය කරන්න.
4. ඒ අවස්ථා යොදාගෙන සිද්ධියක් නිර්මාණය කරන්න.